## ක්ෂේත්‍රය 1 : පදනම් ප්‍රමිතීන්

### ■ ප්‍රජා සහභාගිත්ව ප්‍රමිතිය 1 : සහභාගිත්වය

**අධ්‍යාපනය සඳහා වූ වැඩසැලැස්ම විශ්ලේෂණය කිරීමේදී, සැලසුම් කිරීමේදී, ක්‍රියාවට නැංවීමේදී සහ ඇගයීමේදී ප්‍රජාවේ සමාජිකයින් ක්‍රියාශීලී ලෙස විනිවිදභාවයෙන් යුතුව අවසැලකිල්ලට භාජනය වීමෙන් තොරව සහභාගීවේ.**

**ප්‍රධාන ක්‍රියාකාරකම් :**

- අධ්‍යාපනය සඳහා වූ වැඩසැලසුම් ප්‍රමුඛතා ගත කිරීමේදී සහ සැලසුම් කිරීමේදී ප්‍රජාවේ සාමාජිකයින් ක්‍රියාකාරී ලෙස සහභාගී වේ
- අවදානමට ලක්වී ඇති සියලුම කණ්ඩායම් ප්‍රජා අධ්‍යාපන කමිටු වල නියෝජනය වේ
- අධ්‍යාපන ක්‍රියාකාරකම් සැලසුම් කිරිමේ සහ ක්‍රියාත්මක කිරිමේ සියලුම අවධීන්හිදී ළමුන් සහ තරුණයින් ක්‍රියාකාරී ලෙස සහභාගී වේ
- ප්‍රජාවේ විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන සාමාජිකයින් අධ්‍යාපන වැඩසැලැස්ම විශ්ලේෂණය කිරීමේදී සහ අවදානම අවම කිරිමේ සහ ගැටුම් අවම කිරිමේ ක්‍රියාකාරකම් වලට සහභාගීවේ
- ප්‍රජාවේ සාමාජිකයින්ගේ ශක්‍යතා වර්ධනය කිරීම සඳහා අවස්ථාවන් පැවැතීම

**මාර්ගෝපදේශ සටහන්:**

1. අධ්‍යාපන වැඩසැලැස්මයන් හි සියලුම අවධීන් වලදී ප්‍රජාවේ සාමාජිකයින් ඇතුළත්වීම
2. ප්‍රජාවේ අධ්‍යාපන කමිටු විසින් අධ්‍යාපනය ලබන්නන්ගේ අවශ්‍යතාවන් සහ අයිතිවාසිකම් හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීම
3. ප්‍රජා අධ්‍යාපන කමිටුවේ සාමාජිකයින්ට පැහැදිලිව නිශ්චය කරන ලද කාර්යයභාරයක් සහ වගකීම් තිබීම
4. ප්‍රජාව පදනම් කරගත් දේශිය අධ්‍යාපන සැලසුමක්
5. අධ්‍යාපන ක්‍රියාකාරකම්වලට ළමුන් සහ තරුණයින් සහභාගීවීම
6. අධ්‍යාපන වැඩසටහන් ඇගැයීම සඳහා සමාජ විගණනයන් උපයෝගී කර ගැනීම
7. ජනතාවට සහ සංවිධාන වලට ඔවුන්ගේ අරමුණු කරා ලඟාවීම සඳහා ශක්‍යතා වර්ධනය කිරීම

### ■ ප්‍රජා සහභාගිත්ව ප්‍රමිතිය 2 : සම්පත්

**ප්‍රජාවේ පවතින සම්පත් හඳුනාගෙන සජීවීකරණය කර එක් එක් වයස් කාණ්ඩයන් සඳහා සුදුසු වන අයුරින් අධ්‍යාපනය ලබාගැනීමේ අවස්ථාවන් ලබාදීම සඳහා උපයෝගී කරගැනීම**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනයක් ලබාදීම සඳහා ප්‍රාදේශීයව පවතින සම්පත් හඳුනාගෙන ඒවා සජීවීකරනය කිරීම
- අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීමේදී ප්‍රජාවේ පවත්නා ධාරිතාවන් උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගැනීම
- ආපදා අවදානම් අවම කිරීම සහ ගැටුම් අවම කිරීම අධ්‍යාපනයට ඇතුළත් කිරීම

**මාර්ගෝපදේශ සටහන්:**

1. අධ්‍යාපන වැඩසැලසුම් කිරීමට, සකස් කිරීමට ප්‍රජාවේ සම්පත් උපයෝගී කරගැනීම
2. අවදානමට පත්වී ඇති ළමුන් සහ තරුණයින් සඳහා මෙම අවස්ථාවන් ලබාදීම ප්‍රවර්ධනය සහ ආරක්ෂාව ලබාදීම
3. අධ්‍යාපනය ලබාදීමට සම්බන්ධවන පුද්ගලයින්ගේ කාර්යයභාරයන් සහ වගකීම් පිළිබඳව වූ පුහුණු වැඩසටහන් දිගුකාලීන වශයෙන් යොදාගැනීම සඳහා සුදුසු වන ඒවා විය යුතුයි
4. ප්‍රජා දායකත්වයන් හඳුනාගැනීම
5. දේශීය ධාරිතාවන් සහ කළමණාකරන ක්‍රමෝපායයන් සැලකිල්ලට ගෙන ආපදා අවදානම් අවම කිරීමේ සහ ගැටුම් අවම කිරීමේ අධ්‍යාපනය සැලසුම් කිරීම

## සම්බන්ධීකරණය

### ■ සම්බන්ධීකරණ ප්‍රමිතිය 1 : සම්බන්ධීකරණය

**අධ්‍යාපනය සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණ ස්ථාපිත කර ඇති අතර පාර්ශවකරුවන් සැමටම ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම තහවුරු කිරීමට නොකඩවා ක්‍රියාත්මකවේ**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- අධ්‍යාපන වැඩසැලැසුම් කිරීමේදී අධ්‍යාපන අධිකාරීන් නායකත්ව කාර්යයභාරයක් දරනු ලබයි
- සැලසුම් කිරීම, තොරතුරු කළමණාකරණය, ශක්‍යතාවන් වර්ධනය, සජීවීකරණය සහ අභිදේශනය අන්තර් ආයතන සම්බන්ධීකරණ කමිටුවක් මගින් සිදුවේ
- අධ්‍යාපන මට්ටම් සහ වර්ග පිළිබඳව සැලකිලිමත්වීම
- අධ්‍යාපන ක්‍රියාකාරකම් කලට වේලාවට, විනිවිදභාවයෙන් යුතුව, සමානත්වයෙන් සහ සම්බන්ධීකරණයෙන් යුත් මූල්‍ය ව්‍යුහයන් මගින් සහය ලබාදෙනු ලබයි
- තොරතුරු බෙදාගැනීම සඳහා විනිවිදභාවයෙන් යුත් යාන්ත්‍රණයන් ස්ථාපිත කර තිබේ
- අධ්‍යාපන වැඩසැලසුම්වල ශක්‍යතා සහ හිඩැස් හඳුනාගැනීම සඳහා තක්සේරු කිරීම් සිදුවේ

- පාර්ශවකරුවන් සමානත්වය, විනිවිදභාවය, වගකීම් සහ වගවීමෙන් යුතුව කටයුතු කරති

**මාර්ගෝපදේශ සටහන්:**

1. පුලුල් නියෝජනයකින් යුත් අන්තර් ආයතන සම්බන්ධිකරණ කමිටුවක්
2. සම්පත් උපයෝගී කරගැනීමේදී විනිවිදභාවයෙන් යුක්ත වීම සහ සැවොම අන්තර්ගත වීම
3. තොරතුරු සහ දැනුම කළමනාකරණය
4. අධ්‍යාපනයේ ධාරිතාවන් සහ දුර්වලතා අඩුපාඩු හඳුනා ගැනීම සඳහා ඒකාබද්ධ තක්සේරු
5. තොරතුරු බෙදාගැනීමේදී සහ සම්බන්ධීකරණයේදී පාර්ශවකරුවන් වගවීමෙන් යුක්තව ක්‍රියාකිරීම
6. සියලුම පාර්ශවකරුවන් ප්‍රතිඵල අරමුණු කරගත් ප්‍රවේශයක් අනුගමනය කිරීම

# විශ්ලේෂණය

## ■ විශ්ලේෂණ ප්‍රමිතිය1 : තක්සේරුව

**හදිසි අවස්ථාවන්හිදී අධ්‍යාපනය ලබාදීම සම්බන්ධයෙන් වූ තක්සේරු පූර්ණ විනිවිදභාවයෙන් යුක්ත සහ සහභාගිත්වයෙන් යුතුව සිදු කිරීම**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- අධ්‍යාපනය පිළිබඳ ආරම්භක කඩිනම් තක්සේරුවක් සිදුකිරීම
- දේශීය වශයෙන් අධ්‍යාපනය හා සම්බන්ධ අවශ්‍යතා සහ ක්‍රියාකාරකම් පිළිබඳව පවත්නා අදහස් පිළිබඳ දත්ත එක්රැස් කිරීම
- දේශිය ධාරිතාවන්, සම්පත් සහ ක්‍රමෝපායයන් හඳුනාගැනීම
- සන්දර්භ විශ්ලේෂණයන් සිදුකිරීම
- බලපෑමට ලක්වූ ජනතාව, දත්ත එක්රැස් කිරීමේදි සහ සැලසුම් කිරීමේදී සහභාගීවීම
- අධ්‍යාපන අවශ්‍යතා සහ සම්පත් පිළිබඳව සම්පූර්ණ තක්සේරුවක් සිදු කිරීම
- අන්තර් ආයතන සම්බන්ධිකරන කමිටුව ක්ෂේත්‍රයන් සහ පාර්ශවකරුවන් සම්බන්ධිකරණය කරනු ලබයි

**මාර්ගෝපදේශ සටහන්:**

1. බලපෑමට ලක්වූ ජනතාව සහ තක්සේරු කරන කණ්ඩායමේ ආරක්ෂාව සහ ප්‍රවේසම සලකා බැලීම සඳහා ආරම්භක තක්සේරු සුදුසු කාලයේදී සිදු කිරීම
2. අධ්‍යාපන වැඩසැලැසුම් සහ පවත්නා අවදානම් තත්වයන් හඳුනාගැනීම සඳහා තක්සේරු මගින් විවිධ අංශයන් නිරූපනය වන පරිදි දත්ත එක්රැස් කිරීම
3. ගැටුම් හෝ ආපදාවන් ඇතිවිය නොවන ආකාරයට අධ්‍යාපන වැඩසැලසුම් සුදුසු, අදාළ සහ සංවේදීව සිදුවන බව සහතික කිරීමට සන්දර්භ විශ්ලේෂණයක් සිදු කිරීම
4. දත්ත වල වලංගුභාවය සහ දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයන්
5. අවදානමට මුහුණුපා ඇති කන්ඩායම් වල සාමාජිතයින්ගෙන් සහ අධ්‍යාපන අධිකාරින් යනාදී විවිධ සහභාගිකයින්ගෙන් යුක්ත පිරිස් මෙම තක්සේරු කිරමේ කණ්ඩායම් වල නියේජනය වීම
6. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සහ අනෙක් ක්ෂේත්‍ර අතර සම්බන්ධිකරණය
7. අධ්‍යාපනය සහ මනෝවිද්‍යාත්මක අවශ්‍යතා පිළිබඳ දත්ත එක් රැස් කළ යුතුයි
8. මෙම තක්සේරුවේ ප්‍රතිපළ හැකි ඉක්මනින් ලබාගත යුතුයි

## ■ විශ්ලේෂණ ප්‍රමිතිය 2 : වැඩසැලසුම් ක්‍රමෝපායයන්

**සැමදෙනෙක්ම ආවරණය වන පරිද්දෙ අධ්‍යාපන වැඩසැලසුම් ක්‍රමෝපායයන් වලට සන්දර්භය පිළිබඳ තොරතුරු, අධ්‍යාපනය ලබාගැනීමේ අයිතිවාසිකමට ඇති බාධාවන් සහ මේවා ජයගැනීම සඳහා වූ ක්‍රමෝපායයන් ඇතුළත්වේ**

**ප්‍රධාන ක්‍රියාකාරකම් :**

- තක්සේරුව මගින් සිදුකරන ලද සොයාගැනීම උපයෝගී කරගනිමින් වැඩසැලැස්ම ක්‍රමෝපායයන් සකස් කරනු ලබයි
- අධ්‍යාපන වැඩසැලසුම් මගින් බලපෑම ලක්වූ ජනතාවගේ අවශ්‍යතා සපුරාලනු ලබයි
- වැඩසැලැස්මෙ ක්‍රමෝපායයන් ප්‍රජාවට හානියක් සිදු නොකරයි
- ආරම්භක තක්සේරුවෙන් තොරතුරු එක්රැස් කරගන්නා අතර සන්දර්භය විශ්ලේෂණය කිරීම නිතිපතා යාවත්කාලීන කරුණු ලබයි
- තක්සේරුව සිදු කිරීමට සහ වැඩසැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා ධාරිතාවන් ශක්තිමත් කිරීම
- අධ්‍යාපන වැඩසැලැස්මයන් ජාතික අධ්‍යාපන වැඩසටහන් වලට අනුග්‍රහය දක්වයි
- වැඩසටහන ආරම්භ කිරීමේදී මූලික තොරතුරු රැස්කිරීම සිදුවේ

**මාර්ගෝපදේශ සටහන්:**

1. වැඩසැලසුම් ක්‍රමෝපායයන්, තක්සේරුවේ මූලික සොයාගැනීම් මත පදනම් වේ
2. දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය සඳහා ශක්‍යතා වර්ධනය කිරීම
3. 'අනර්ථයක් නොකරන්න' ප්‍රතිපත්ති අනුව ප්‍රයත්න දැරීම
4. හදිසි අවස්ථා පවතින අවස්ථාවන්හිදී වැඩසැලැසුම් ක්‍රමෝපායයන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම
5. අරමුදල් සපයන්නන් විසින් අධ්‍යාපනය සඳහා වැඩසැලැස්මයන් හි ගුණාත්මකභාවය සහ සියලු දෙනාට ප්‍රවේශවීමේ හැකියාව නිතිපතා සමාලෝචනයට ලක්කිරීම

6. ජාතික අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීම
7. අවදානම් අවම කිරීම සහ සූදානම් කිරීමේ ක්‍රියාකාරකම් ශක්තිමත් කරයි
8. සංවිධානයන්හි අනිවාර්ය උපදෙස් වල පවතින බාධාවන් ඉවත් කරගැනීමට උපකාරීවීම
9. පාදක තොරතුරු එක්රැස් කිරීම

### ■ *විශ්ලේෂණ ප්‍රමිතිය 3 : අධීක්ෂණය*

**අධ්‍යාපන වැඩසැලැසුම් ක්‍රියාකාරකම් නිතිපතා අධික්ෂණය සහ බලපෑමට ලක්වූ ජනතාවගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පැනනගින අවශ්‍යතා සැලකිල්ලට යොමුකිරීම**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- අධ්‍යාපන වැඩසැලසුම් අධීක්ෂණය කිරීම සඳහා කාර්යක්ෂම ක්‍රම තිබීම
- අධීක්ෂණය කිරීම මගින් ඉගෙනුම ලබන්නන්ගේ ආරක්ෂාව සහ ප්‍රවේසම තහවුරු කිරීම
- අවධානමට ලක්විය හැකි පුද්ගලයින්ද අධික්ෂණ කණ්ඩායම් වලට ඇතුළත්වීම
- අධ්‍යාපනය සම්බන්ධ සවිස්තරාත්මක හෝ ස්ත්‍රී පුරුෂ වයස් කාණ්ඩ ආදිය පදනම් කර වර්ග කරන ලද තොරතුරු දත්ත එක්රැස් කිරීම
- මෙම දත්ත විශ්ලේෂණය කර පාර්ශවකරුවන් සමග නිතිපතා බෙදාගැනීම

**මාර්ගෝපදේශ සටහන්:**

1. අධ්‍යාපන වැඩසටහන් වල බලපෑම අධික්ෂණය කිරීම
2. සංස්කෘතික වශයෙන් සංවේදී ආකාරයට මෙම තොරතුරු එක්රැස් කිරීම
3. අධ්‍යාපනය සම්බන්ධ දත්ත සම්පාදනය සහ විශ්ලේෂණය කිරීම සඳහා අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය භාවිතා කිරීම
4. අධ්‍යාපනය ලබන්නන් එම අධ්‍යාපනය ලබන අවස්ථාවේදී සහ පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව අධික්ෂණය කිරීම

### ■ විශ්ලේෂණය ප්‍රමිතිය 4 : ඇගයීම

**ක්‍රමානුකූල සහ අපක්ෂපාති ඇගයීම් මගින් අධ්‍යාපන වැඩසැලැසුම් ඉහළ නංවන අතර වගවීම වැඩි කරයි**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- ඇගයීම් මගින් අනාගත වැඩසටහන් සැලසුම් කරගැනීමට අවශ්‍ය වන්නාවූ දත්ත ලබාදේ
- ඇගයීම් ක්‍රියාකාරකම් වලට පාර්ශවකරුවන් සම්බන්ධවේ
- උගත් පාඩම් සහ යහභාවිතයන් පුළුල් වශයෙන් බෙදාගනු ලබයි

**මාර්ගෝපදේශ සටහන්:**

1. අධික්ෂණය සහ ඇගයීම අතර වෙනස
2. අධ්‍යාපන වැඩසැලැස්ම ක්‍රියාකාරකම් ඇගයීම
3. සුදුසු ඇගයීම් මගින් අදාළ පාර්ශවකරුවන්ගේ ශක්‍යතාවයන් සංවර්ධනය කිරීම
4. ඇගයීම් වලින් සොයාගත් කරුණු සහ උගත් පාඩම් බෙදාගැනීම

## ක්ෂේත්‍රය 2 : ප්‍රවේශවීමේ හැකියාව සහ ඉගෙනීමට සුදුසු වාතාවරණය

### ■ *ප්‍රවේශවීමේ හැකියාව සහ ඉගෙනීමට සුදුසු වාතාවරණය ප්‍රමිතිය 1 : අධ්‍යාපනය ලබාගැනීමේ සමාන අවස්ථාවන් පැවැතීම*

**සියලුම පුද්ගලයින්ට ගුණාත්මක භාවයෙන් ඉහළ සහ ඔවුන්ට අදාළ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාවන් පැවැතීම**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- අවසැලකිල්ල මත අධ්‍යාපනය ලබාගැනීමට ඇති අවස්ථාවන් අහිමි නොවීම
- සියලුම දෙනාට ඉගෙනීමේ ව්‍යුහයන්ට සහ පරිසරයන්ට ලඟාවීමට හැකිවීම
- ඇතුළත්වීමට ඇති බාධාවන් ඉවත්කර තිබීම
- විධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනික ක්‍රියාකාරකම් සපයා තිබීම
- ගුණාත්මක වශයෙන් ඉහළ සහ අදාළ අධ්‍යාපනයක් ලබාගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාව සම්බන්ධවී සිටීම
- අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය සම්පත් පැවැතීම
- ඉගෙනුම ලබන්නන් ට විධිමත් අධ්‍යාපනය ලැබීමට ඇතුලුවීමට හෝ නැවත ඇතුලු වීමට අවස්ථාව තිබීම
- සරණාගතයින් සඳහා අධ්‍යාපන වැඩසටහන් සත්කාරක ප්‍රජාව සහ අදාළ රට විසින් හඳුනාගෙන තිබීම
- අධ්‍යාපන වැඩසටහන් මගින් සත්කාර ප්‍රජාවට සෘනාත්මක බලපෑමක් ඇති නොවීම

**මාර්ගෝපදේශ සටහන්:**

1. අවසැලකිල්ලකින් තොරව අධ්‍යාපනය ලබාගැනීමට අවස්ථාව තහවුරු කිරීම
2. ඇතුළත් කරගැනීම, ලියාපදිංචිවීම සහ සිසුන් රඳවා ගැනීම වැඩි කරගැනීමට හැකිවන ආකාරයට අවශ්‍ය ලේඛන නීති රීති නම්‍යශීලී වීම

3. ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපන අවස්ථාවන් රාශියක් පැවතීම
4. අධ්‍යාපන අවස්ථාවන් නම්‍යශීලී සහ සන්දර්භයට සුදුසු අයුරින් පැවතීම
5. ආරම්භක තක්සේරුව පදනම් කරගෙන ඉක්මනින් අධ්‍යාපනික අවස්ථාවන් සැකසීම
6. ගුණාත්මක වශයෙන් ඉහළ අදාළ අධ්‍යාපනික අවස්ථාවන්
7. ප්‍රජාව ක්‍රියාකාරී ලෙස අධ්‍යාපන ක්‍රියාවලියට සම්බන්ධවී සිටීම
8. ජාතික අධිකාරීන් සම්පත් ලබාදීමට මූලික වගකීම දැරීම
9. අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති පහසුකම් (පාසල් ගොඩනැගිලි ආදිය) තාවකාලික වාසස්ථාන වශයෙන් යොදාගැනීම අවම කිරීම

## ■ ප්‍රවේශවීමේ හැකියාව සහ ඉගෙනීමට සුදුසු වාතාවරණය ප්‍රමිතිය 2 : රැකවරණය සහ යහ පැවැත්ම

**ඉගෙන ගන්නා පරිසරය ඉගෙනුම ලබන්නන්ගේ ගුරුවරුන්ගේ සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයින්ගේ මනෝ සමාජයීය යහපැවැත්ම ප්‍රවර්ධනය සහ ආරක්ෂා කරන්නා වූ ආරක්ෂාකාරී සහ ප්‍රවේසමෙන් යුතු එකක් වීම**

### ප්‍රධාන ක්‍රියාකාරකම්:

- ඉගෙනුම ලබන පරිසරය හානිකර මුලාශ්‍රයන්ගෙන් තොරවීම
- ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයින් ඉගෙනීම සඳහා සුදුසු වාතාවරණයක් සැකසීමට අවශ්‍ය කුසලතාව ලබාගැනීම
- අධ්‍යාපනය ලබාදෙන්නා වූ ස්ථානයන් අදාළ ප්‍රජාවට සමීපව පැවැතීම
- මේවාට ලඟාවීමට ඇති මාර්ග ආරක්ෂාකාරී සුරක්ෂිත සහ ලගාවීමට පහසු ඒවා වීම
- ඉගෙනුම ලබාගන්නා පරිසරය හමුදාමය ක්‍රියාකාරකම් හා යුධමය තත්ත්වයන්ගෙන් තොරවීම
- තීරණ ගැනීමේදී ප්‍රජාව දායකවීම
- ආරක්ෂාකාරී ඉගෙනීමේ වාතාවරණයක් පවත්වාගෙන යාම

### මාර්ගෝපදේශ සටහන්:

1. ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත ඉගෙනීමේ වාතාවරණයක්
2. චිත්තවේගීමය, ශාරීරික සහ සමාජ සුභසාධනයට සහයවන්නා වූ ක්‍රියාකාරකම් පැවැතීම
3. ගුරුවරන් සහ ඉගෙනුම ලබන්නන් අනතුරු පිළිබඳව දැනුවත්ව සිටීම සහ ඒවායින් ආරක්ෂාවීම
4. ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සැලසුම් සකස් කිරීම
5. ඉගෙනුම ලබන්නන් සහ ඉගෙනුම ලබන ස්ථාන අතර පවතින දුර ප්‍රමාණය ප්‍රාදේශීය සහ දේශීය සම්මතයන් අනුව නිශ්චය කිරීම
6. අධ්‍යාපනය ලබාගැනීමට පැමිණෙන මාර්ග සුරක්ෂිත බව තහවුරු කිරීම සඳහා ඇතිවිය හැකි තර්ජන සම්බන්ධයෙන් අවශ්‍ය පියවරගෙන තිබීම
7. ප්‍රහාර වලින් අධ්‍යාපනය ආරක්ෂා කර තැබීම
8. සමාජ යහපැවැත්ම සහ මනෝසමාජයීය සහයෝගය පිළිබඳව පුහුණු ලබාදීම
9. ප්‍රචණ්ඩකාරී නොවන ලෙස පන්ති කාමර කළමණාකරණය කිරීම
10. අධ්‍යාපනය ලබාදීමේ වාතාවරණය සැකසීමේදී, පවත්වාගැනීමේදී සහ ආරක්ෂා කිරීමේදී ප්‍රජාවේ සහභාගිත්වය ලබාගැනීම
11. ආපදාවන් වැළැක්වීම පිළබඳව ගුරුවරුන්ට සහ අධ්‍යාපනය ට සම්බන්ධ වෙනත් පුද්ගලයින්ට පුහුණුවක් ලබාදීම

## ■ ප්‍රවේශවීමේ හැකියාව සහ ඉගෙනීමට සුදුසු වාතාවරණය ප්‍රමිතිය 3: පහසුකම් සහ සේවාවන්

**අධ්‍යාපනය ලබාදීම සඳහා සලසා ඇති පහසුකම් මගින් ඉගෙනුම ලබන්නන්ගේ, ගුරුවරුන්ගේ සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම නංවාලන අතර මේ සඳහා ඔවුන් සෞඛ්‍ය, පෝෂණ, මනෝසමාජයීය සේවාවන් ආදී සමාජ සුභසාධන සේවාවන් වලට සහ ආරක්ෂාව සැපයීමේ සේවාවන් හා සම්බන්ධ කර තිබීම**

### ප්‍රධාන ක්‍රියාකාරකම්:

- ඉගෙනීම ලබන ස්ථාන සහ ව්‍යුහයන් ආරක්ෂාකාරී සහ පහසුවෙන් ලඟාවීමට හැකිය
- ඉගෙනීම ලබන ස්ථානයන් ආපදාවන්ට ඔරොත්තු දෙන්නාවූ සැලසුම් සහ ඉදිකිරීම් වලින් සමන්විතය
- ඉගෙනීම ලබාදෙන්නා වූ ස්ථානයන් ආරක්ෂාකාරී සීමාමායිම් වලින් සහ සංඥාපුවරු වලින් සමන්විතය
- අධ්‍යාපනය ලබාදීම සඳහා ඇති භෞතික ව්‍යුහයන් සුදුසු පරිදි සැකසී ඇත
- පංති කාමර ව්‍යුහයන් සහ අවකාශය සහභාගිත්ව ක්‍රමයන් ප්‍රවර්ධනය කරයි
- ප්‍රජාවේ සාමාජිකයින් තරුණයින්ද ඇතුලුව අධ්‍යාපනය ලබාදෙන්නා වූ ස්ථානයන් ගොඩනැංවීමේදී සහ නඩත්තු කිරීමේ දී සහය ලබාදේ
- පෞද්ගලික ස්වස්ථතාවය සඳහා බීමට සුදුසු ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සපයා ඇත
- සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව පිළිබඳ අධ්‍යාපනය ප්‍රවර්ධනය කර ඇත
- පාසල පදනම් කරගත් සෞඛ්‍ය සහ පෝෂණ සේවාවන් පැවැතීම
- මෙම අධ්‍යාපනය ලබාදෙන්නා වූ ස්ථාන ළමා ආරක්ෂාව සෞඛ්‍ය, පෝෂණය, සමාජ සහ මනෝ සමාජයීය සේවා සමග සම්බන්ධකර ඇත

### මාර්ගෝපදේශ සටහන්:

1. අධ්‍යාපන පහසුකම් පිහිටුවා ඇති ස්ථාන සමානත්වය සහ ශාරීරික ආරක්ෂාව ප්‍රවර්ධනය කරනු ලබයි
2. අධ්‍යාපන පහසුකම් වල ව්‍යුහයන් සැලසුම් සහ ඉදිකිරීම් ආරක්ෂාකාරී මෙන්ම සැමටම ලබාගත හැකිවේ

3. අධ්‍යාපන පහසුකම් සැලසුම් කිරීමේදී ආබාධිත පුද්ගලයින්ගේ අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් විය යුතුය
4. අධ්‍යාපනය සඳහා ඇති වාතාවරණයන් සැලසුම් කිරීම සහ නඩත්තු කිරීමේදී ඒවා භාවිතා කරන්නන් සැලකිල්ලට ගනු ලබයි
5. අධ්‍යාපනය ලබාදෙන ස්ථාන ආශ්‍රිතව සනීපාරක්ෂක පහසුකම් ඇත
6. අධ්‍යාපනය ලබාදෙන ස්ථානය ස්වස්ථතාවය ප්‍රවර්ධනය කළ යුතු අතර බීමට සුදුසු ජල මූලාශ්‍ර තිබිය යුතුය
7. පාසල පදනම් කරගත් සෞඛ්‍ය සහ පෝෂණ සේවා සමගින් අධ්‍යාපනය, පෝෂණය, සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව සම්බන්ධ කිරීම
8. ප්‍රදේශීය වශයෙන් ලබාදෙන සේවාවන් ලබාගැනීමටත් ශාරීරික මනෝසමාජයීය සහ චිත්වේගීමය යහපැවැත්ම ප්‍රවර්ධන කිරීමට අවශ්‍ය යොමුකිරීම් පැවැතීම

## ක්ෂේත්‍රය 3 : ඉගැන්වීම සහ ඉගෙනීම්

### ■ *ඉගැන්වීම සහ ඉගෙනීමේ ප්‍රමිතිය 1 : විෂය මාලා*

**විධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනය ලබාදීම සඳහා සන්දර්භයට සංස්කෘතිකමය සහ භාෂාමය වශයෙන් අදාළ වන ඉගෙනුම ලබන්නන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන විෂය මාලාවක් උපයෝගී කරගනු ලැබේ**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- විෂයයමාලා සංවර්ධනයේදී අධ්‍යාපන අධිකාරීන් පාර්ශවකරුවන් සම්බන්ධවේ
- අධ්‍යාපන ආධාරක සහ විෂයය මාලාව ඉගෙනුම ලබන්නනගේ අවශ්‍යතාවන්ට සුදුසුවේ
- සරණාගතයින්ට සහ අභ්‍යන්තර අවතැන්වුවන් සඳහා වු විභාග සහ විෂයය මාලා දේශීය සහ සත්කාරක රජයයන් විසින් පිළිගනු ලබයි
- විෂයය මාලාව මගින් ආපදා අවදානම් අවම කරලීම, පරිසරය පිළිබඳ අධ්‍යාපනය සහ ගැටුම් වැළැක්වීම උගන්වනු ලබයි
- විෂයය මාලාව මගින් මූලික අධ්‍යාපනයේ නිපුණතාවයන් සපුරාලනු ලබයි
- ඉගෙනුම ලබන්නන්ගේ මනෝ සමාජීය යහපැවැත්ම සහ ආරක්ෂාව සම්බන්ධ අවශ්‍යතා පිළිබඳව විෂය මාලාවේදී අවධානය යොමු කෙරේ
- ඉගෙනුම ලබන්නන්ගේ සහ ගුරුවරුන්ගේ භාෂාවෙන් ඉගෙනුම් ආධාරක සහ උපදෙස් ලබාදේ
- විෂයය මාලාව සහ උපදෙස් ආධාරක විවිධත්වයට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීභාවයෙන් යුක්තය
- ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ආධාරක ප්‍රමාණවත්ව සපයා ඇත

**මාර්ගෝපදේශ සටහන්:**

1. විෂය මාලාව පිළිබඳව නිර්වචනය
2. විෂයය මාලාව සන්දර්භයට, වයස් මට්ටම් වලට සහ සංවර්ධනයේ මට්ටම් වලට සුදුසුවේ
3. විෂයය මාලාව සමාලෝචනය සහ සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය
4. විෂයය මාලාවට අඩංගු විය යුතු කරුණු සංවර්ධනය කිරීමට සහ ගුරුවරුන් පුහුණු කිරීමට පෙර ප්‍රධාන හැකියාවන් හඳුනාගනී
5. ජීවන කුසලතා වලට අදාල ඉගෙනුම් අන්තර්ගතයන් සහ ප්‍රධාන සංකල්පයන් ඉගෙනුම ලබන්නන්ට අදාළ වේ
6. ඉගෙනුම ලබන්නන් සහ ගුරුවරුන්ගේ මනෝ සමාජයීය අවශ්‍යතා, අයිතිවාසිකම් සහ සංවර්ධනය සැලකිල්ලට ගනු ලබයි
7. උපදෙස් ලබාදෙන භාෂාව පාර්ශවකරුවන්ගේ කැමැත්ත අනුව තීරණය කරනු ලබයි
8. අධ්‍යාපනික ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී විවිධත්වය සැලකිල්ලට ගනු ලබයි
9. දේශීය වශයෙන් ලබාගත හැකි අධ්‍යාපනික ආධාරක තිබීම

### ■ *ඉගැන්වීම සහ ඉගැනීමේ ප්‍රමිතිය 2 : පුහුණුව වෘත්තීමය සංවර්ධනය සහ සහයෝගය*

**ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයින්ට ඔවුන්ගේ අවශ්‍යතා සහ තත්වයන්ට අනුකූලව නිශ්චිත කාලසීමාවකට වරක් සුදුසු සහ ව්‍යුහාත්මක පුහුණුවක් ලැබේ**

**ප්‍රධාන ක්‍රියාකාරකම් :**

- ගුරුවරුන්ගේ අවශ්‍යතාවන්ට අනුව පුහුණු අවස්ථා පැවැතීම
- මෙම පුහුණුව සන්දර්භයට අදාළ වේ
- මෙම පුහුණුව අධිකාරීන් විසින් පිළිගැනීමට සහ අනුමැතියට ලක්වේ
- පුහුණු පාඨමාලා සුදුසුකම් ලත් පුහුණුකරුවන් විසින් පවත්වනු ලබයි
- පුහුණුව මගින් ගුරුවරුන් කාර්යක්ෂම පහසුකම් සලසන්නන් බවට පත් කරයි
- විධිමත් සහ නොවිධිමත් විෂයය මාලාව පිළිබඳව දැනුම සහ කුසලතා මෙම පුහුණුවට ඇතුළත්වේ

**මාර්ගෝපදේශ සටහන්:**

1. "ගුරුවරයා " යන්නෙහි නිර්වචනය
2. අධ්‍යාපන අධිකාරීන් විසින් විධිමත් පුහුණු විෂයය මාලාව සහ එහි අඩංගු කරුණු සංවර්ධනය කිරීම

3. අධ්‍යාපන අධිකාරීන් විසින් පුහුණුවට සහයෝගය දැක්වීම සහ සම්බන්ධීකරණය සිදු කිරීම
4. අධ්‍යාපන අධිකාරීන් විසින් පුහුණුව පිළිගැනීම සහ නිල වශයෙන් සහතික කිරීම
5. විශේෂ ඉගැන්වීම් අවශ්‍යතා හඳුනාගැනීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම
6. අනාගතයේදී ඇතිවිය හැකි ආපදාවන් වැළැක්වීම සහ අවම කිරීම සම්බන්ධයෙන් ඉගෙනුම ලබන්නන්ට සහ ප්‍රජාවට සහාය වන්නේ කුමක ආකාරයටදැයි ගුරුවරුන් පුහුණු කිරීම

## ■ ඉගැන්වීමේ සහ ඉගෙන ගැනීමේ ප්‍රමිතිය 3 : උපදෙස් ලබාදීම සහ ඉගෙනුම් ක්‍රියාවලිය

**උපදෙස් සහ ඉගෙනුම් ක්‍රියාවලිය ඉගෙනගනු ලබන්නා කේන්ද්‍ර කරගත, සියලුදෙනා ඇතුළත් වන්නාවූ සහභාගිත්ව ක්‍රියාවලියක් වීම**

### ප්‍රධාන ක්‍රියාකාරකම්:

- ඉගෙනුම් ලබන්නන්ගේ අවශ්‍යතාවන්ට සුදුසුවන ආකාරයට ඉගැන්වීමේ ක්‍රම සකස්වීම
- ඉගැන්වීමේ කුසලතාවන් පිළිබඳව අවබෝධය සහ විෂයෙහි අඩංගු කරුණු පිළිබඳව අවබෝධය ගුරුවරුන් තුලින් විදහා දක්වේ
- උපදෙස් හා ඉගෙනුම් ක්‍රියාවලි මගින් ඉගෙනුම ලබන සියලු දෙනාගෙ අවශ්‍යතාවන්ට පිළිතුරු සපයති
- දෙමාපියන් සහ ප්‍රජා නායකයින් විෂයෙහි අඩංගු කරුණු සහ ඉගැන්වීමේ ක්‍රම පිළිගනු ලබයි

### මාර්ගෝපදේශ සටහන්:

1. ඉගෙනුම ලබන්නන් සියලුම දෙනා ක්‍රියාකාරීව සහභාගී වන බවට ඉගැන්වීමේදී තහවුරු කරනු ලබයි
2. හදිසි අවස්ථාවකදී ඉගෙනීමේ වැදගත්කම පිළිබඳව පාර්ශවකරුවන් සහ ප්‍රජා සාමාජිකයින් සමග සාකච්ඡා කිරීමට ගුරුවරුන් පුහුණු කර ඇත
3. ඉගැන්වීමේ ක්‍රම අදාළ සන්දර්භයට සහ ඉගෙනගනු ලබන්නා ගේ අවශ්‍යතා වලට සුදුසු වේ

## ■ ඉගැන්වීමේ සහ ඉගෙන ගැනීමේ ප්‍රමිතිය 4 : ඉගෙනීමේ ප්‍රතිඵල තක්සේරු කිරීම

**ඉගෙනීමේ ලැබෙන ප්‍රතිඵල ඇගයීමට සහ වලංගු බවට පත්කිරීමට සුදුසු ක්‍රම යොදාගනු ලැබේ**

### ප්‍රධාන ක්‍රියාකාරකම්:

- ඉගෙනුම ලබන්නන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම සහ ඇගයීමට ලක්කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල ඉගැන්වීම් ක්‍රම සංවර්ධනයට යොදාගැනේ
- ලබාගත් ප්‍රතිඵල පිළිගනු ලබන අතර ඉගෙනුම අවසන් කළ බව සහතික කිරීමට ලේඛන සපයනු ලැබේ
- තාක්ෂණික සහ වෘත්තීමය වැඩසටහන් සම්පූර්ණ කළ අය තක්සේරුවට ලක්කිරීම
- සාධාරණ සහ විශ්වාසදායී තක්සේරු කිරීමේ සහ ඇගයීමේ ක්‍රම
- ඉගෙන ගනු ලබන්නනගේ අනාගත අවශ්‍යතාවන්ට මෙම තක්සේරු අදාළවීම

### මාර්ගෝපදේශ සටහන්:

1. කාර්යක්ෂම තක්සේරු සහ ඇගයීම් ක්‍රම සහ මිනුම්
2. තක්සේරු ප්‍රතිඵල අධ්‍යාපන අධිකාරීන් විසින් පිළිගැනීම
3. ආචාර ධර්ම සැලකිල්ලට ගනිමින් තක්සේරු සහ ඇගයීමේ ක්‍රම සංවර්ධනය කර තිබීම
4. තක්සේරු කිරීම් වල අඩංගු කරුණු සහ ක්‍රියාවලියේ අදාළ බව

# ක්ෂේත්‍රය 4 : ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයින්

## ■ ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයින් සම්බන්ධ ප්‍රමිතිය 1 : බඳවා ගැනීම සහ තෝරාගැනීම

**අදාළ සුදුසුකම් සපුරනු ලැබූ ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් විවිධත්වය සහ සමානත්වය පදනම් කරගත් තෝරාගැනීමේ ක්‍රියාපටිපාටියක් අනුගමනය කරමින් සහභාගිත්ව සහ විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලියක් මගින් බඳවා ගැනීම**

### ප්‍රධාන ක්‍රියාකාරකම්:

- බඳවාගැනීමට පෙර පැහැදිලි සේවා විස්තර සහ මාර්ගෝපදේශ සකස් කර තිබීම
- නියෝජිතයින් ගෙන් සැදුම් ලත් තෝරාගැනීමේ කමිටුවක් මගින් ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින් තෝරාගනු ලබයි
- ප්‍රමාණවත් තරම් පුද්ගලයින් ප්‍රමාණයක් බඳවාගැනිම සහ යෙදවීම

### මාර්ගෝපදේශ සටහන්:

1. සේවා විස්තරයේ ප්‍රධාන සංරචක
2. හදිසි අවස්ථාවක් සඳහා ගුරුවරුන්ගේ පළපුරුද්ද හෝ සුදුසුකම්
3. ගුරුවරුන් තෝරාගැනීම සඳහා ක්‍රියාපටිපාටිය
4. හැකි අවස්ථාවන්හිදී නිර්දේශ පරීක්ෂා කිරීම
5. දේශීය වශයෙන් තීරණය කරන ලද ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළහැකි සිසුන් සංඛ්‍යාවකින් යුක්ත පන්ති

## ■ ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින් ප්‍රමිතිය 2 : වැඩ කිරීමේ කොන්දේසි

**ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින්ට වැඩ කිරීමේ සේවා කොන්දේසි පැහැදිලිව නිශ්චය කර තිබීම සහ සුදුසු පරිදි වේතන ලබාදීම**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- වේතන සහ වැඩ කිරීමේ කොන්දේසි පිළිබඳව පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය කර තිබීම
- වේතන සහ වැඩ කිරීමේ කොන්දේසි සේවා කොන්ත්‍රාත් වල පැහැදිලිව දක්වා තිබීම
- ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින්ට සංවිධානය වීමට සහ වැඩ කිරීමේ කොන්දේසි පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාව තිබීම
- ආචාර ධර්ම පද්ධතියක් ස්ථාපිත කර තිබීම සහ එයට ගරු කිරීම

**මාර්ගෝපදේශ සටහන්:**

1. සේවා ගිවිසුමේ සේවා කොන්දේසි ඇතුළත්වීම
2. ප්‍රමාණවත් සහ සුදුසු වේතන දීමනා තීරණය කිරීම සහ ප්‍රමාණවත් ලෙස බෙදාහැරීම
3. ආචාර ධර්ම පද්ධතියේ ප්‍රධාන සංරචක සේවා ගිවිසුමේහි ඇතුළත් කර තිබීම

## ■ ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින් සම්බන්ධ ප්‍රමිතිය 3 : සහය ලබාදීම සහ අධීක්ෂණය

**ගුරුවරුන්ට සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින්ට සහය ලබාදීමේ හා අධික්ෂණ යාන්ත්‍රණ කාර්යක්ෂමව ලෙස ක්‍රියාත්මකවීම**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- ප්‍රමාණවත් ඉගෙනුම් ආධාරක හා අවකාශයන්/ඉඩ ප්‍රස්ථා තිබීම
- ගුරුවරුන්ගේ අභිප්‍රේරණය වැඩිකිරීමට සහ දායකවීම සහ ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයට වෘත්තීයමය සංවර්ධනය සහයක් වීම
- ගුරුවරුන්ට නිතිපතා සහය සැලසීමට සහ තක්සේරු කිරීමට සුපරීක්ෂණ ක්‍රම ස්ථාපිත කර තිබීම
- කාර්යසාධන ඇගයුම් සිදු කිරීම ලේඛනගත කිරීම සහ නිතිපතා සාකච්ඡාවට ලක් කිරීම
- ගුරුවරුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සිසුන් විසින් වැඩසැලැස්ම දැක්වීම
- ගුරුවරුන් සඳහා මනෝසමාජයීය සහයෝගය ලබාදීම

**මාර්ගෝපදේශ සටහන්:**

1. ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ආධාරක සහ අවකාශය මගින් කාර්යක්ෂමව ඉගැන්වීමට ඉඩසැලසීම
2. සහය දක්වන සහ සුපරීක්ෂණ යාන්ත්‍රණ මගින් ගුරුවරුක්ගේ අභිප්‍රේරණය සහ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම
3. ගුරුවරුන්ගේ ධාරිතාවන් ශක්තිමත් කිරීම: පුහුණුව සහ වෘත්තීයමය සංවර්ධනය පිළිබඳ උපදේශනය
4. කාර්යය මණ්ඩල ක්‍රියාකාරිත්වය ඇගයීම සහ ක්‍රියාවලිය
5. ඉගෙනුම ලබන්නන් තක්සේරු කිරීමේ සහ ඇගයීමේ ක්‍රියාවලීන්ට ඇතුළත් කිරීම
6. ගුරුවරුන්ට මනෝ සමාජයීය සහයෝගය සහ සුභ සාධනය

# ක්ෂේත්‍රය 5 : අධ්‍යාපන ප්‍රතිපත්ති

## ■ අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රමිතිය 1 : නීති සහ ප්‍රතිපත්ති සම්පාදනය

**නොමිළයේ සහ සියලුදෙනාටම පාසල් අධ්‍යාපනය ලබාගැනීමද ඇතුලව අධ්‍යාපනය යථාතත්වයට පත්කිරීමට සහ ගුණාත්මක අධ්‍යාපනයක් නොකඩවා ලබාදීම ප්‍රමුඛත්වයේ ලා අධ්‍යාපන අධිකාරීන් කටයුතු කරයි**

**ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- නීති විධිවිධාන සහ ප්‍රතිපත්තීන් අධ්‍යාපන පහසුකම් කාර්යය මණ්ඩලය සහ ඉගෙනීම ලබන්නන් ආරක්ෂා කිරීමට සහය දක්වනු ලබයි
- නීති විධිවිධාන සහ ප්‍රතිපත්ති මගින් අධ්‍යාපනය ලබාගැනීමට ඇති අයිතියට ගරුකිරීම හා ආරක්ෂා කිරීම සිදු කරනු ලබයි
- නීති විධිවිධාන සහ ප්‍රතිපත්ති අධ්‍යාපනය ලබාගැනීමට ඇති පහසුකම්වල ආරක්ෂාකාරී බව තහවුරු කරනු ලබයි
- සහභාගී සන්දර්භ විශ්ලේෂණ පදනම් කර ගෙන නීති විධිවිධාන සහ ප්‍රතිපත්ති සකස් කිරීම
- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හදිසි අවස්ථාවන් සඳහා ක්ෂණිකව වැඩසැලැස්ම දැක්වීමට ඉඩ ප්‍රස්ථා ලබාදේ
- සරණාගතයින් සඳහා වූ පාසල් වලට ඔවුන් අයිති රටවල විෂයය මාලාව සහ භාෂාව භාවිතා කිරීමට ඉඩ ලබාදේ
- හදිසි අවස්ථා වැඩසටහන් වලදී අධ්‍යාපනය ලබාදීමට සම්බන්ධ වීමට රාජ්‍ය නොවන අංශයන්ට ඉඩ ලබාදේ

**මාර්ගෝපදේශ සටහන්:**

1. අධ්‍යාපනය සම්බන්ධ අයිතීන්ට ගරුකිරීමට ආරක්ෂා කිරීමට සහ සම්පූර්ණ කිරීම සඳහා ජාතික

අධිකාරීන් සතු වගකීම

2. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සහ නීති සියලුදෙනාටම නොකඩවා අධ්‍යාපනය ලබාදීම තහවුරු කළ යුතුයි
3. අලුතින් සහ නැවත යථාතත්වයට පත්කරන පාසල් හානිකර සහ තර්ජන වලින් තොර විය යුතුයි
4. නීති සහ ප්‍රතිපත්ති සන්දර්භ විශ්ලේෂණය පිළිබඳව අවධානය යොමු කළ යුතුයි
5. විශ්වාසදායී තොරතුරු පද්ධති සහ ප්‍රතිපත්ති සංවර්ධනය කරන්නන් අතර තොරතුරු බෙදාගැනීම
6. අධ්‍යාපනය ජාතික ආපදා සඳහා සූදානම් කිරීමේ වැඩසැලැස්මේ අංගයක් ලෙස පැවැතිය යුතුයි
7. අධ්‍යාපනය සමාන අන්දමින් සියලුම කණ්ඩායම් වලට ලබාගත හැකි විය යුතුයි
8. රාජ්‍ය නොවන සංවිධාන සහ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරීන්ට ජාතික අධ්‍යාපනයට දායක වීමට සහය වීමට අවස්ථාව ලබාදීම

## ■ *අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රමිතිය 2 : සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම*

**අධ්‍යාපන ක්‍රියාකාරකම් වලදී අන්තර්ජාතික සහ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති, නීති ප්‍රමිතීන් සහ සැලසුම් සහ බලපෑමට ලක්වූ ජනතාවගේ ඉගෙනුම් අවශ්‍යතා සැලකිල්ලට ගනු ලබයි**

### ප්‍රධාන ක්‍රියාකාරකම්:

- අධ්‍යාපන වැඩසටහන් අන්තර්ජාතික සහ ජාතික වැඩසැලසුම් සහ ප්‍රතිපත්ති නිරූපනය කරයි
- අධ්‍යාපන ක්‍රියාකාරකම් වෙනත් හදිසි අවස්ථා වැඩසැලැස්ම සමග ඒකාබද්ධ කිරීම
- හදිසි අවස්ථා අධ්‍යාපනය දිගුකාලීන විශාල පරිමානයේ ජාතික අධ්‍යාපන සැලසුම සමග සම්බන්ධ කිරීම
- අනාගත සහ වර්තමාන හදිසි තත්වයන් සඳහා අධ්‍යාපන සැලසුම් සකස් කිරීම
- කාර්යක්ෂම සහ විනිවිදභාවයේ යුත් ප්‍රතිපත්ති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් පැවැතීම

### මාර්ගෝපදේශ සටහන්:

1. අධ්‍යාපන වැඩසටහන් අධ්‍යාපන අයිතිවාසිකම් සහ අරමුණ සපුරාලිය යුතුයි
2. අධ්‍යාපන වැඩසැලැසුම් අනෙකුත් ක්ෂේත්‍රයන් හා සම්බන්ධ කළ යුතුයි
3. ජාතික සහ ප්‍රාදේශිය අධ්‍යාපන සැලසුම් අනාගතයේ ගතයුතු පියවර සම්බන්ධයෙන් පැහැදිලි කරයි
4. සම්පත් වෙන් කිරීම සහ සම්බන්ධිකරණය දේශිය නායකත්වයෙන් සිදුකිරීම
5. අරමුදල් විනිවිදභාවයෙන් සහ සම්බන්ධිකරණයෙන් යුතුව ලබාදීම




***අධ්‍යාපනය ලබාදීමේ අවම ප්‍රමිතීන් සූදානම්වීම, වැඩසැලසුම සහ යථාතත්වයට පත්කිරීම*** මගින් ළමුන්ට, තරුණයින්ට සහ වැඩිහිටියන් යන සියලුම පුද්ගලයින්ට අධ්‍යාපනය ලබාගැනීමට අයිතියක් ඇති බව පැහැදිලි කරනු ලබයි. මෙම ප්‍රමිතීන් මගින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවයේ අවම ප්‍රමිතීන් සහ හදිසි අවස්ථාවන්හිදී යථාතත්වයට පත්කිරීම මගින් එම අවස්ථාවන් ලබාගැනීමට අවස්ථාව සැලසීම පිළිබඳව පැහැදිලි කරනු ලබයි.

මෙම ප්‍රමිතීන් සංවර්ධනය කරන ලද්දේ 2003 – 2004 වසර වලදී සිදු කරන ලද ඉතා උසස් උපදේශනාත්මක ක්‍රියාවලියක් මගින් වන අතර 2009 – 2010 කාලයේදී මේවා යාවත්කාලීන කරන ලදී. මෙම ප්‍රමිතීන් ළමයින් ගේ අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තිය, වසර 2000 දී ඩකා හිදී සියලුම අරමුණු සඳහා අධ්‍යාපනය, - සහ ස්ෆියර් ව්‍යාපෘතියේ මානුෂීය ප්‍රඥප්තිය පදනම් කරගෙන ඇති INEE අවම ප්‍රමිතීන් පිළිබඳ විමර්ශන මෙවලම INEE අවම ප්‍රමිතීන් පිළිබඳ අත්පොත සමගින් සුසංයෝගීයව භාවිතා කළ යුතුවේ. මෙය ප්‍රයෝජනවත් පුහුණු මෙවලමක් වන අතර එමගින් මෙය භාවිතා කරන්නන්ට INEE අවම ප්‍රමිතීන් යොදාගන්නා ආකාරය, ආයතන ගත කරන අයුරු සහ සන්දර්භයට අනුව යොදාගැනීම පිළිබඳ විමර්ශනයක් ලබාදීමට උපයෝගී කරගත හැකිය. වැඩිදුර තොරතුරු සඳහා www.ineesite.org/standards වෙබ් අඩවියට පිවිසෙන්න.

ඔබ මෙම INEE අවම ප්‍රමිතීන් අධ්‍යාපනය වැඩසටහන් හෝ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සඳහා යොදාගත් ආකාරය පිළිබඳව අප සමග බෙදා ගැනීමට කරුණාකර INEE සම්බන්ධීකාරක අමතන්න minimumstandards@ineesite.org අප ඔබේ අදහස් බලාපොරොත්තුවෙන් සිටිමු.

INEE අවම ප්‍රමිතීන් අත්පොතේ, අවම ප්‍රමිතීන් පිළිබඳ විමර්ශන මෙවලමේ, INEE මෙවලම් කට්ටලයේ මුද්‍රිත පිටපත් ලබාගැනීම සඳහා කරුණාකර materials@ineesite.org අමතන්න

හදිසි අවස්ථාවන්හිදී අධ්‍යාපනය ලබාදීම සම්බන්ධ අන්තර් ආයතන ජාලය (INEE – Inter Agency Network for Education in Emergencies) යනු හදිසි අවස්ථාවන්හිදි සහ පශ්චාත් අර්බුද සමයන්හිදී එමගින් බලපෑමට ලක්වන සියලු දෙනාටම ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනයක් ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම හැකි වාතාවරණයක් ඇතිකිරීම පිණිස කටයුතු කරන ක්‍රියාකාරකයින්ගෙන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගෙන් සැදුම් ලත් සෑම දෙනාටම විවෘත ගෝලීය මට්ටමේ ජාලයකි. www.ineesite.org

INEE සමග එක්වන්න www.ineesite.org/join

අපගේ සාමාජිකයකු වන්න. අපගේ සම්පත් කට්ටලයන් ද්විමාසිකව ලබාගන්න. අපගේ ප්‍රජාවට සහයවන්න.

**INEE** | Inter-Agency Network for Education in Emergencies
හදිසි අවස්ථාවන්හිදී අධ්‍යාපනය ලබාදීම පිළිබඳ අන්තර් ආයතන ජාලය
அவசர கால நிலைகளில் கல்விக்கான நிறுவனங்களுக்கு இடையிலான வலையமைப்பு

# සැලැස්ම

## අධ්‍යාපනය සඳහා අවම ප්‍රමිතීන්: සූදානම්වීම, වැඩසැලසුම, යථාතත්වයට පත් කිරීම

### මූලික ප්‍රතිපත්ති

**ප්‍රජා සහභාගිත්ව ප්‍රමිතීන් :** සහභාගිත්වය සහ සම්පත් - **සම්බන්ධීකරණ ප්‍රමිතීන් :** සම්බන්ධීකරණය - **විශ්ලේෂණ ප්‍රමිති :** තක්සේරුව, වැඩසැලසුම් ක්‍රමෝපායයන්, අධීක්ෂණය, ඇගයීම

### ප්‍රවේශවීමේ හැකියාව සහ ඉගෙනීමට සුදුසු වාතාවරණය

**ප්‍රමිතිය 1 : සියලුම දෙනාට ලබාගත හැකිබව** සියලුම පුද්ගලයන්ට සුදුසු සහ ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනය ලැබීමට ඇති හැකියාව

**ප්‍රමිතිය 2 : ආරක්ෂාව සහ යහපැවැත්ම** ඉගෙනුම ලබන පරිසරය ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගතබව සහ ඉගෙනුම ලබන්නන්ගේ ගුරුවරුන්ගේ සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ මනෝසමාජයීය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම

**ප්‍රමිතිය 3 : පහසුකම් සහ සේවා** අධ්‍යාපන පහසුකම්, ඉගෙන ගන්නා අයගේ ගුරුවරුන්ගේ සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරන අතර ඔවුන් සෞඛ්‍ය පෝෂණය මනෝසමාජයීය සහ ආරක්ෂණ සේවාවන් සමග සම්බන්ධ කරයි

### ඉගැන්වීම සහ ඉගෙනීම

**ප්‍රමිතීන් 1 : විෂයය මාලාව** අදාළ සන්දර්භයට සහ ඉගෙනුම ලබන්නන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන විධිමත් සහ අවිධිමත් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්කෘතිකමය සමාජමය සහ භාෂාමය වශයෙන් අදාළ විෂයය මාලාවක් යොදාගනු ලබයි

**ප්‍රමිතීන් 2 : පුහුණුව, වෘත්තීය සංවර්ධනයට සහය** ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින්ට අවශ්‍යතාවන්ට සහ තත්වයන්ට අදාළ සහ ව්‍යුහගත පුහුණුවක් නිශ්චිත කාලසීමාවකට වරක් ලබාදීම

**ප්‍රමිතිය 3 : උපදෙස් සහ ඉගෙන ගැනීමේ ක්‍රියාවලිය** උපදෙස් සහ ඉගෙනුම් ක්‍රියාවලිය ඉගෙන ගනු ලබන්නා කේන්ද්‍රකරගත් සහභාගිත්වයෙන් සිදුවන සහ අන්තර්ගතවූ ආකාරයෙන් සිදුවීම

**ප්‍රමිතිය 4 : ඉගෙනගත් කරුනු වල ප්‍රතිඵල තක්සේරුව** ඉගෙනගැනීමෙන් ලත් ප්‍රතිපල තක්සේරු කිරීම සහ වලංගුබව පිරික්සීමට සුදුසු ක්‍රමවේදයන් යොදාගැනීම

### ගුරුවරු සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින්

**ප්‍රමිතිය 1 : බඳවාගැනීම සහ තෝරාගැනීම** අදාළ සුදුසුකම් සපුරනු ලැබූ ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පුද්ගලයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් විවිධත්වය සහ සමානත්වය පදනම් කරගත් තෝරාගැනීමේ ක්‍රියාපටිපාටියක් අනුගමනය කරමින් සහභාගිත්ව සහ විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලියක් මගින් බඳවා ගැනීම

**ප්‍රමිතිය 2 : සේවා කොන්දේසි** ගුරුවරුන් සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින්ට වැඩ කිරීමේ සේවා කොන්දේසි පැහැදිලිව නිශ්චය කර තිබීම සහ සුදුසු පරිදි වේතන ලබාදීම

**ප්‍රමිතිය 3 : සහය ලබාදීම සහ සුපරික්ෂණය** ගුරුවරුන්ට සහ අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් පුද්ගලයින්ට කාර්යක්ෂම ලෙෂ ක්‍රියාත්මකවීම සඳහා සහය හා අධික්ෂණ යාන්ත්‍රන පැවැතීම

### අධ්‍යාපන ප්‍රතිපත්ති

**ප්‍රමිතිය 1 : නීති සහ ප්‍රතිපත්ති සම්පාදනය** අධ්‍යාපන අධිකාරීන් නොමිළයේ සහ සියලුදෙනාටම පාසල් අධ්‍යාපනය ලබාගැනීමද ඇතුලුව අධ්‍යාපනය යථාතත්වයට පත්කිරීමට සහ ගුණාත්මක අධ්‍යාපනයක් නොකඩවා ලබාදීම ප්‍රමුඛත්වයේ ලා කටයුතු කරයි

**ප්‍රමිතිය 2 : සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම** අධ්‍යාපන ක්‍රියාකාරකයින් අන්තර්ජාතික සහ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති නීති සහ ප්‍රමිතීන් සහ සැලසුම් සහ බලපෑමට ලක්වූ ප්‍රජාවගේ ඉගෙනීමේ අවශ්‍යතා සැලකිල්ලට ගනු ලබයි

INEE

Inter-Agency Network for Education in Emergencies
හදිසි අවස්ථාවන්හිදී අධ්‍යාපනය ලබාදීම පිළිබඳ අන්තර් ආයතන ජාලය
அவசர கால நிலைகளில் கல்விக்கான நிறுவனங்களுக்கு
இடையிலான வலையமைப்பு

# INEE අවම ප්‍රමිතීන්
# විමර්ශන මෙවලම

## අවම ප්‍රමිතීන් පිළිබද අත්පොත සමග භාවිතා කිරීම සඳහා
## විමර්ශන මෙවලම




INEE අවම ප්‍රමිතීන් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම විසින් සකසන ලදී.